# දැන්වීමයි !

## අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයෙහි දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල කාර්ය මණ්ඩල යටතේ අනුමත ප්‍රාථමික - අර්ධ ශිල්පීය සේවා ගණයේ බංගලා භාරකරු හා අරක්කැමි තනතුර සඳහා ඉල්ලුම්පත් කැඳවීම.

0.1.අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ප්‍රාථමික - අර්ධ ශිල්පීය සේවා ගණයේ බංගලා භාරකරු හා අරක්කැමි තනතුරු විසිපහක් (25) සඳහා නිලධරයන් බඳවා ගැනිමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලය පවරන ලද අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ (පත්වීම් බලධරයා) අනුමැතිය ප්‍රකාරව අයදුම්පත් කැඳවනු ලැබේ.

0.2.යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල අනුව කුසලතා මත සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයන්, පවතින පුරප්පාඩු සඳහා පත් කරනු ඇත.

0.3.2016.02.25 දිනැතිව නිකුත් කරන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 අනුව, ප්‍රාථමික - අර්ධ ශිල්පීය සේවා ගණයේ බංගලා භාරකරු හා අරක්කැමි - III ,II හා I ශ්‍රේණි වලට අදාළ මාසික වැටුප් පරිමාණය PL2-2016 රු.25,250 – 10 x 270 – 10 x 300 – 10 x 330 – 12 x 350 රු. 38,450 වේ. රු.25,250/- න් ඔබ්බට යාම සඳහා II වන ශ්‍රේණියට උසස් වීමද රු. 28,250/- න් ඔබ්බට යාම සඳහා I වන ශ්‍රේණියට උසස් වීමද රු.31,280/- න් ඔබ්බට යාම සඳහා විශේෂ ශ්‍රේණියට උසස් වීමද ලබා ගත යුතුය. එම චක්‍රලේඛයේ II උපලේඛනයේ සඳහන් පරිදි ගෙවීම් සිදු කරනු ලැබේ.

0.4.තනතුරට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට නිලධාරීන් යටත් විය යුතු වේ.

0.5.කිසියම් සුවිශේෂී හේතුවක් මත යම් නිලධාරියෙකු ස්ථාන මාරු කිරීමට පත්වීම් බලධරයා තීරණය කරනු ලබන තාක් පළමු පත්වීම ලැබූ දිස්ත්‍රික් ලේකම්/දිසාපති නිල නිවසෙහි සේවය කළ යුතුය.

0.6.සුදුසුකම්

ප්‍රාථමික - අර්ධ ශිල්පීය සේවා ගණයේ බංගලා භාරකරු හා අරක්කැමි තනතුරුවලට බඳවා ගැනීම සඳහා පහත සඳහන් සුදුසුකම් අදාළ වේ.

(අ) ශ්‍රී ලාංකික පුරවැසියෙක් විය යුතු ය.

(ආ) අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

(ඇ) අධ්‍යාපන සුදුසුකම් - අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයන් හයක් සමත්වී තිබීම.

(ඈ) වෘත්තිය සුදුසුකම් - තනතුරෙහි කාර්යභාරයට අදාළ තෘතියික හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තිය කුසලතාවන්හී (N.V.Q) දෙවැනි (02) මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

(ඉ) පළපුරුද්ද - ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි ශ්‍රේණිගත සංචාරක හෝටලයක හෝ සත්කාරක ක්ෂේත්‍රයේ සේවා ස්ථානයක මාස 06 ක සේවා පළපුරුද්ද

(ඊ) කායික සුදුසුකම් - සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් මනා කායික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

0.9.නියමිත ආදර්ශ ආකෘතියට අනුකූලව අයදුම්පත්‍රය ඉදිරිපත් කළ යුතු ය. ඊට අනුකූල නොවන නිවැරදිව සම්පූර්ණ කර නොමැති අසම්පූර්ණ තත්ත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. නිසි පරිදි අයදුම් පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරුවන් විසින් දරාගත යුතුය.

10.0.මේ සමග අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුව තමන් විසින්ම සකස් කරන ලද අයදුම්පත් 2019 සැප්තැම්බර් 12 වන දිනට පෙර ලේකම්,අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහපළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය, ස්වදේශ කටයුතු අංශය,"නිල මැදුර", ඇල්විටිගල මාවත,කොළඹ 05 යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවීමට කටයුතු කරන්න.

11.0.අයදුම්පත්‍ර බහා එවන කවරයේ වමත් පස ඉහළ කෙළවරේ **"ප්‍රාථමික - අර්ධ ශිල්පීය සේවා ගණයේ බංගලා භාරකරු හා අරක්කැමි තනතුරු සඳහා බඳවා ගැනීම"** යන්න සඳහන් කරන්න.

12.0.මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නියමිත දිනට හෝ එදිනට පෙර හෝ ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කර ඇති සියලු අයදුම්කරුවන් අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහපළාත් සභා හා පළාත් පාලනඅමාත්‍යාංශය විසින් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. එහෙත් එසේ කැඳවීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා නිවේදනය අනුව සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේ අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

13.0.අපේක්ෂකයින්ගේ අනන්‍යතාව සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියකියවිලිවලින් එකක් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු ය.

i. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත

ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය.

14.0. මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත්, ඒ සම්බන්ධව ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් විසින් තීරණය කරනු ඇත. සියලුම අයදුම්කරුවන් මෙම නිවේදනයේ සඳහන් පොදු නීතිරීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

.......................................................

(අමාත්‍යාංශ ලේකම්/ දෙපාර්තමේන්තු ප්‍රධානියා)

2019.08.26 වෙනි දින

ස්වදේශ කටයුතු අංශය,

අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහපළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය,

"නිල මැදුර",

ඇල්විටිගල මාවත,

කොළඹ 05.

අයදුම්පත් 2019.09.12 දින හෝ ඊට පෙර **ලේකම්, අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය, "නිල මැදුර", ඇල්විටිගල මාවත,කොළඹ 05.** යන ලිපිනයට යොමු කරන්න.

# ආදර්ශ අයදුම්පත්‍රය

## ප්‍රාථමික - අර්ධ ශිල්පීය සේවා ගණයේ බංගලා භාරකරු හා අරක්කැමි තනතුර සඳහා බඳවා ගැනීම

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

[ ]

අයදුම්කරන භාෂා මාධ්‍ය

සිංහල - 2

දෙමළ - 3 [ ]

ඉංග්‍රීසි - 4

සේවය කිරීමට මනාපය දක්වන දිස්ත්‍රික් ලේකම් කාර්යාලය } :........................................................

1. මුලකුරු සමඟ නම :................................................
2. සම්පූර්ණ නම :................................................
3. ජාතික හැඳුනුම්පත් අංකය : [ | | | | | | | | | | | ]
4. ස්ථිර ලිපිනය :................................................
5. ස්ත්‍රී / පුරුෂ භාවය [ ] ස්ත්‍රී - 1 පුරුෂ - 0
6. උපන් දිනය : වර්ෂය : [ | | | ] මාසය : [ | ] දිනය : [ | ]
7. දුරකථන අංකය [ | | | | | | | | | ] :
8. අධ්‍යාපන සුදුසුකම් :

අ.පො.ස. (සා.පෙළ) විභාගය පිළිබඳ විස්තර

(i) පළමුවර ප්‍රතිපල : වර්ෂය හා මාසය:........................ විභාග අංකය : ..........................

| විෂයය | ශ්‍රේණිය | විෂයය | ශ්‍රේණිය |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

13. අයදුම්කරුගේ සහතිකය :

(අ). මෙම ඉල්ලුම්පත්‍රයේ මවිසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් කොටස් සම්පූර්ණ නොකිරීමෙන් සහ / හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදු විය හැකි අලාභය විඳදරා ගැනීමට එකඟ වෙමි. තව ද මෙහි සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බව ද ප්‍රකාශ කරමි

(ආ). මා විසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත්, පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සෙකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බවද දනිමි.

(ඇ). මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

දිනය :.........................................

.........................................................

අයදුම්කරුගේ අත්සන